(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 73. ]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2025 අගෝස්තු 06 බදාදා පූ.භා. 9.30 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **(වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා,** කථානායකතුමා

ගරු **(වෛද්‍ය) රිස්වි සාලි මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

ගරු **හේමාලි වීරසේකර මහත්මිය,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය

---

ගරු **ආචාර්ය හරිනි අමරසූරිය,** අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය

ගරු **(මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා,** රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **(මහාචාර්ය) ක්‍රිශාන්ත අබේසේන මහතා,** විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා

ගරු **අනුර කරුණාතිලක මහතා,** නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමා

ගරු **සුනිල් කුමාර ගමගේ මහතා,** තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා

ගරු **රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා,** ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා

ගරු **කුමාර ජයකොඩි මහතා,** බලශක්ති අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,** සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **(ආචාර්ය) අනිල් ජයන්ත මහතා,** කම්කරු අමාත්‍යතුමා සහ ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා,** අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) දම්මික පටබැඳි මහතා,** පරිසර අමාත්‍යතුමා

ගරු **සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය,** කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමිය

ගරු **බිමල් රත්නායක මහතා,** ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **ආනන්ද විජේපාල මහතා,** මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා

ගරු **කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා,** වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා

ගරු **වසන්ත සමරසිංහ මහතා,** වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා,** බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා

ගරු **සුනිල් හඳුන්නෙත්ති මහතා,** කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා

ගරු **විජිත හේරත් මහතා,** විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා

ගරු **සජිත් ප්‍රේමදාස මහතා,** පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු **චතුරංග අබේසිංහ මහතා,** කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නාමල් කරුණාරත්න මහතා,** කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජනිත රුවන් කොඩිතුවක්කු මහතා,** වරාය සහ සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **රත්න ගමගේ මහතා,** ධීවර, ජලජ සහ සාගර සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **එරංග ගුණසේකර මහතා,** තරුණ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා,** ප්‍රවාහන සහ මහාමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඇන්ටන් ජයකොඩි මහතා,** පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **මහින්ද ජයසිංහ මහතා,** කම්කරු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා,** ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ගමගෙදර දිසානායක මහතා,** බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **වසන්ත පියතිස්ස මහතා,** ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුන්දරලිංගම් ප්‍රදීප් මහතා,** වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **මුනීර් මුලාෆර් මහතා,** ජාතික ඒකාබද්ධතා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(මහාචාර්ය) රුවන් රණසිංහ මහතා,** සංචාරක නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා,** ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) හංසක විජේමුණි මහතා,** සෞඛ්‍ය සහ ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **එරංග වීරරත්න මහතා,** ඩිජිටල් ආර්ථික නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **උපාලි සමරසිංහ මහතා,** සමූපකාර සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ටී. බී. සරත් මහතා,** නිවාස නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) නාමල් සුදර්ශන මහතා,** කාන්තා සහ ළමා කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **පී. රුවන් සෙනරත් මහතා,** පළාත් සභා සහ පළාත් පාලන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා,** අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අරුන් හේමචන්ද්‍ර මහතා,** විදේශ කටයුතු සහ විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නලින් හේවගේ මහතා,** වෘත්තීය අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **රොෂාන් අක්මීමන මහතා**

ගරු **අජිත් අගලකඩ මහතා**

ගරු **අම්ර්තනාදන් අඩෛක්කලනාදන් මහතා**

ගරු **අබූබකර් අතම්බාවා මහතා**

ගරු **හෙක්ටර් අප්පුහාමි මහතා**

ගරු **රෝහිත අබේගුණවර්ධන මහතා**

ගරු **(මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා**

ගරු **(වෛද්‍ය) නිහාල් අබේසිංහ මහතා**

ගරු **(වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**

ගරු **ජේ.සී. අලවතුවල මහතා**

ගරු **එම්.කේ.එම්. අස්ලම් මහතා**

ගරු **හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා**

ගරු **මංජුල සුරවීර ආරච්චි මහතා**

ගරු **(ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය**

ගරු **බී. ආරියවංශ මහතා**

ගරු **(වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**

ගරු **කේ. ඉලංකුමාරන් මහතා**

ගරු **අර්කම් ඉල්යාස් මහතා**

ගරු **එම්.එස්. උදුමාලෙබ්බේ මහතා**

ගරු **ඔෂානි උමංගා මහත්මිය**

ගරු **ගයන්ත කරුණාතිලක මහතා**

ගරු **රවී කරුණානායක මහතා**

ගරු **ක්‍රිෂ්නන් කලෙයිචෙල්වි මෙනෙවිය**

ගරු **ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**

ගරු **උපුල් කිත්සිරි මහතා**

ගරු නීතිඥ චමින්ද්‍රාණී කිරිඇල්ල මහත්මිය

ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා

ගරු වසන්ත පුෂ්ප කුමාර මහතා

ගරු චමින්ද ලලිත් කුමාර මහතා

ගරු නීතිඥ සරත් කුමාර මහතා

ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය

ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා

ගරු එම්.ඒ.සී.එස්. චතුරි ගංගානි මහත්මිය

ගරු මනෝ ගනේෂන් මහතා

ගරු ලසිත් භාෂණ ගමගේ මහතා

ගරු තිලංක යූ. ගමගේ මහතා

ගරු අජන්ත ගම්මැද්දෙගේ මහතා

ගරු චතුර ගලප්පත්ති මහතා

ගරු නිහාල් ගලප්පත්ති මහතා

ගරු අජිත් ගිහාන් මහතා

ගරු (වෛද්‍ය) ජගත් ගුණවර්ධන මහතා

ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය

ගරු අශෝක ගුණසේන මහතා

ගරු ඩී. වී. චානක මහතා

ගරු ගයාන් ජනක මහතා

ගරු රුවන්තිලක ජයකොඩි මහතා

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු දිලිත් ජයවීර මහතා

ගරු නිශාන්ත ජයවීර මහතා

ගරු නීතිඥ තුෂාරි ජයසිංහ මහත්මිය

ගරු ටී.කේ. ජයසුන්දර මහතා

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා

ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා

ගරු එම්. ඒ. එම්. තාහිර් මහතා

ගරු (වෛද්‍ය) සෙල්ලතම්බි තිලකනාදන් මහතා

ගරු නීතිඥ අනුෂ්කා තිලකරත්න මහත්මිය

ගරු චන්දන තෙන්නකෝන් මහතා

ගරු චාමර සම්පත් දසනායක මහතා

ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

ගරු තනුර දිසානායක මහතා

ගරු ධර්මප්‍රිය දිසානායක මහතා

ගරු සුජීව දිසානායක මහතා

ගරු නීතිඥ සුසන්ත දොඩාවත්ත මහතා

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා

ගරු සුසන්ත කුමාර නවරත්න මහතා

ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා

ගරු කිංස් නෙල්සන් මහතා

ගරු නන්දන පත්මකුමාර මහතා

ගරු අරුණ පනාගොඩ මහතා

ගරු නිමල් පලිහේන මහතා

ගරු නිශාන්ත පෙරේරා මහතා

ගරු අජිත් පී. පෙරේරා මහතා

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා

ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා

ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා

ගරු ස්ටෙෆනි ප්‍රනාන්දු මහතා

ගරු කන්දසාමි ප්‍රභු මහතා

ගරු අමිල ප්‍රසාද් මහතා

ගරු ලාල් ප්‍රේමනාත් මහතා

ගරු නන්ද බණ්ඩාර මහතා

ගරු පද්මසිරි බණ්ඩාර මහතා

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා

ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා

ගරු රිසාඩ් බදියුදීන් මහතා

ගරු සුදත් බලගල්ල මහතා

ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මහතා

ගරු ඊ.එම්. බස්නායක මහතා

ගරු විජේසිරි බස්නායක මහතා

ගරු සුනිල් බියන්විල මහතා

ගරු (වෛද්‍ය) සඳරුවන් මදරසිංහ මහතා

ගරු ලුතිනන් කොමාණ්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා

ගරු ජගත් මනුවර්ණ මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු කේ. කාදර් මස්තාන් මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු චානක මාදුගොඩ මහතා

ගරු රුවන් මාපලගම මහතා

ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා

ගරු ඉස්මායිල් මුත්තු මොහොමඩ් මහතා

ගරු ධනුෂ්ක රංගනාත් මහතා

ගරු සංජීව රණසිංහ මහතා

ගරු ආර්.එම්. සමන්ත රණසිංහ මහතා

ගරු සුනිල් රත්නසිරි මහතා

ගරු ආර්.එම්. ගාමිණී රත්නායක මහතා

ගරු මංජුල සුගත් රත්නායක මහතා

ගරු ඒ.එම්.එම්.එම්. රත්වත්තේ මහත්මිය

ගරු අසෝක සපුමල් රන්වල මහතා

ගරු තුරෙරාසා රවිකරන් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා

ගරු මනෝජ් රාජපක්ෂ මහතා

ගරු සුනිල් රාජපක්‍ෂ මහතා

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා

ගරු නීතිඥ හසාරා ලියනගේ මහත්මිය

ගරු දීප්ති වාසලගේ මහත්මිය

ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා

ගරු කංචන වැලිපිටිය මහතා

ගරු ආර්.ජී. විජේරත්න මහතා

ගරු නීතිඥ ප්‍රියන්ත විජේරත්න මහතා

ගරු රුවන් විජේවීර මහතා

ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා

ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය

ගරු චමින්ද විජේසිරි මහතා

ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා

ගරු ජගත් විතාන මහතා

ගරු දිලිප් වෙදආරච්චි මහතා

ගරු අතුල වෙළඳගොඩ මහතා

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා

ගරු ෆස්මින් ෂරීෆ් මහතා

ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා

ගරු තිළිණ සමරකෝන් මහතා

ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා

ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා

ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මහතා

ගරු දේවානන්ද සුරවීර මහතා

ගරු චන්දන සූරියආරච්චි මහතා

ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා

ගරු අරවින්ද සෙනරත් මහතා

ගරු කිට්නන් සෙල්වරාජ් මහතා

ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා

ගරු (වෛද්‍ය) ජනක සේනාරත්න මහතා

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා

ගරු කබීර් හෂීම් මහතා

ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා

ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා

ගරු චම්පික හෙට්ටිආරච්චි මහතා

ගරු දිනිඳු සමන් හෙන්නායක මහතා

ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය

ගරු දිනේෂ් හේමන්ත මහතා

**ගරු නීතිඥ ගීතා හේරත් මහත්මිය**

**ගරු නීතිඥ භාග්‍ය ශ්‍රී හේරත් මහතා**

**ගරු මුහම්මද් ෆයිසාල් මහතා**

**ගරු රියාස් ෆාරුක් මහතා**

කුෂානි රෝහණදීර මහත්මිය, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

චමින්ද කුලරත්න මහතා, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

හංස අබේරත්න මහතා, සහකාර මහ ලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස් විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1. කථානායකවරයා විසින් කරනු ලබන නිවේදන:** කථානායකවරයා විසින් මතු පළවන නිවේදනය කරන ලදී:—

"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව, ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ අභියෝගයට ලක් කරන ලද 'ජාතික විගණන (සංශෝධන)' නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණ තීරණය මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැන්වීමට කැමැත්තෙමි.

කාරක සභා අවස්ථාවේ දී ඉදිරිපත් කිරීමට යෝජිත සංශෝධන සම්බන්ධයෙන් සෑහීමට පත්වන බැවින්, S.C. (SD) 21/2025 යන පෙත්සම ඉදිරිපත් කරන ලද පෙත්සම්කරුවන් විසින් එම පෙත්සම ඉල්ලා අස් කර ගත් බව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දැනුම් දී තිබේ.

ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය අද දින කාර්ය සටහන් දැක්වෙන නිල වාර්තාවේ මුද්‍රණය කළ යුතු යැයි මම නියෝග කරමි."

**2. ලිපිලේඛනාදිය පිළිගැන්වීම:** (1) කථානායකවරයා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව 2024 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ තෙවැනි කාණ්ඩයේ I කොටස ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි ද, මුද්‍රණය කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

(2) කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යවරයා විසින් 2023 වර්ෂය සඳහා උක් පර්යේෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(3) කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යවරයා විසින් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 120(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(4) වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යවරයා විසින් 2024 වර්ෂය සඳහා ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(5) තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යවරයා විසින් 2023 වර්ෂය සඳහා ජාතික තරුණ සේවා සභාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(6) සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119 (4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**3. කාරක සභා වාර්තා පිළිගැන්වීම:** (1) පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති, ගරු හෙක්ටර් අප්පුහාමි මහතා විසින් එම කාරක සභාව වෙත යොමු කරන ලද —

(i) 2023 වර්ෂය සඳහා ජාතික සමූපකාර සංවර්ධන ආයතනයේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2020, 2021, 2022 හා 2023 වර්ෂ සඳහා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ කාර්ය සාධන වාර්තා

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(2) ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති, ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය වෙනුවෙන් එම කාරක සභාවේ සාමාජික මන්ත්‍රී ගරු විජේසිරි බස්නායක මහතා විසින් එම කාරක සභාව වෙත යොමු කරන ලද —

(i) 2023 වර්ෂය සඳහා මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව;

(ii) 2023 වර්ෂය සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව; සහ

(iii) 2022 වර්ෂය සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ වාර්ෂික වාර්තාව

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

**4. මහජන පෙත්සම් පිළිගැන්වීම:**

(1) (i) කොළඹ 05, කැප්පෙටිපොළ මාවත, සමුළු නිවාස, අංක 12/සී දරන ස්ථානයෙහි පදිංචි ඩී.එම්.ආර්.ඩී.එස්. රාජකරුණා මහතාගෙන් සහ වෙනත් නව දෙනෙකුගෙන් ලැබුණු 2025.05.07 දිනැති පෙත්සම; සහ

(ii) දෙහිවල, ශ්‍රී සරණංකර පාර, සරණංකර ටෙරස්, අංක 04 දරන ස්ථානයෙහි පදිංචි කේ. ගාමිණී පුණ්‍යසිරි ප්‍රනාන්දු මහතාගෙන් ලැබුණු 2025.04.20 දිනැති පෙත්සම

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා විසින් පිළිගන්වන ලදී.

(2) තුම්මෝදර, ලබුගම, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය යන ස්ථානයෙහි සේවයේ නියුතු අයි.ඩී.ඩී.එල්. සමරනායක මහතාගෙන් ලැබුණු 2025.03.26 දිනැති පෙත්සම ගරු අර්කම් ඉල්යාස් මහතා විසින් පිළිගන්වන ලදී.

(3) මාතර, වැවහමන්දුව, අංක 18 දරන ස්ථානයෙහි පදිංචි ටී. සුරවීර මහතාගෙන් ලැබුණු 2025.05.05 දිනැති පෙත්සම ගරු අජන්ත ගම්මැද්දෙගේ මහතා විසින් පිළිගන්වන ලදී.

(4) පිටිගල, ගාල්ලෙ ගෙදර වත්ත, බොරළුහේන පන්සල පාර යන ලිපිනයෙහි පදිංචි එම්. විමලසේන මහතාගෙන් ලැබුණු 2025.05.02 දිනැති පෙත්සම ගරු ටී.කේ. ජයසුන්දර මහතා විසින් පිළිගන්වන ලදී.

(5) (i) කළුතර දකුණ, මහ හීනටියංගල, කන්දෙවත්ත, සුවසේවා මාවත, අංක 153/4 දරන ස්ථානයෙහි පදිංචි බී.එච්.ඩී.එච්. තිලකරත්න මහතාගෙන් ලැබුණු 2025.01.27 දිනැති පෙත්සම;

(ii) කළුතර, නාගොඩ, බෝධියවත්ත, අංක 62/19 බී, 4 වැනි පටුමග දරන ස්ථානයෙහි පදිංචි ආර්.එස්. විමලසිරි ද සිල්වා මහතාගෙන් ලැබුණු 2024.11.25 දිනැති පෙත්සම; සහ

(iii) හොරණ, මුණගම, තක්ෂිලා උයන, අංක 156 දරන ස්ථානයෙහි පදිංචි ආර්.එච්.එම්. රණසිංහ මහතාගෙන් ලැබුණු 2025.02.20 දිනැති පෙත්සම

ගරු නන්දන පත්මකුමාර මහතා විසින් පිළිගන්වන ලදී.

(6) කෑගල්ල, නිල්වක්ක, 'ඉන්ද්‍රජිත්', අංක ඊ 7 දරන ස්ථානයෙහි පදිංචි බී.ඒ. කරුණාතිලක මහතාගෙන් ලැබුණු 2025.05.19 දිනැති පෙත්සම ගරු ස්ටෙෆනි ප්‍රනාන්දු මහතා විසින් පිළිගන්වන ලදී.

(7) නාරම්මල, බෙම්මුල්ලෙගෙදර, මීවැව, බෝමළු වත්ත යන ලිපිනයෙහි පදිංචි ඩී.බී. මානෙල් සෝමරත්න මහත්මියගෙන් ලැබුණු 2025.03.10 දිනැති පෙත්සම ගරු විජේසිරි බස්නායක මහතා විසින් පිළිගන්වන ලදී.

(8) කෑගල්ල, මහ රෝහල, වෛද්‍ය ලේඛන සහකාර යන ස්ථානයෙහි සේවයේ නියුතු කේ.එම්.යූ.එස්. ජාලිය බණ්ඩාර මහතාගෙන් සහ වෙනත් දෙදෙනෙකුගෙන් ලැබුණු 2025.03.07 දිනැති පෙත්සම ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා විසින් පිළිගන්වන ලදී.

30(10) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**5. පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය:** ගරු කේ. කාදර් මස්තාන් මහතා, ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මහතා ස්ථිර කරමින් ඉදිරිපත් කළ යෝජනාව,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"ශ්‍රී ලංකා පහසුකම් කළමනාකරණ ආයතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ඒ අනුව, පනත් කෙටුම්පත පළමුවර කියවා මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 52(6) අනුව වාර්තා කිරීම සඳහා පනත් කෙටුම්පත නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යවරයා වෙත යොමු කරන ලදී.

**6. ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත් කෙටුම්පත:** දෙවැනිවර කියවීමේ නියෝගය කියවන ලදී.

"පනත් කෙටුම්පත දැන් දෙවැනිවර කියවිය යුතු ය"යි බලශක්ති අමාත්‍යවරයා වෙනුවෙන් ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

(පූ.භා. 11.47 ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

(අ.භා. 1.00 ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

"ගරු අරවින්ද සෙනරත් මහතා මූලාසනාරූඪ විය යුතු ය"යි කම්කරු අමාත්‍යතුමා සහ ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 1.36 ට ගරු අරවින්ද සෙනරත් මහතා මූලාසනාරූඪ විය.)

"ගරු චානක මාදුගොඩ මහතා මූලාසනාරූඪ විය යුතු ය"යි බලශක්ති අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 2.45 ට ගරු චානක මාදුගොඩ මහතා මූලාසනාරූඪ විය.)

"ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනාරූඪ විය යුතු ය"යි නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 3.51 ට ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, පාර්ලිමේන්තුව මතු පළවන අන්දමට පක්ෂව 121; විරුද්ධව 25 යනුවෙන් බෙදී, එය සභා සම්මත විය.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 47(2)(ආ) අනුකූලව විද්‍යුත් ඡන්ද විමසීම් ක්‍රමය භාවිතයෙන් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් එකසිය හතළිස් හයදෙනෙකු (146) පහත සඳහන් ආකාරයට ඡන්දය ප්‍රකාශ කරන ලදී:—

| | |
|---|---|
| G 001. K.V. Samantha Viddyarathna | Yes |
| G 002. Sunil Handunnetti | Yes |
| G 004. Vijitha Herath | Yes |
| G 005. Nalinda Jayathissa | Yes |
| G 006. Bimal Rathnayake | Yes |
| G 007. Harini Amarasuriya | Yes |
| G 009. Ramalingam Chandrasekar | Yes |
| G 010. Wasantha Samarasinghe | Yes |
| G 017. Ananda Wijepala | Yes |
| G 018. Hiniduma Sunil Senevi | Yes |
| G 019. Sunil Kumara Gamage | Yes |
| G 020. Kumara Jayakody | Yes |
| G 022. Anura Karunathilaka | Yes |
| G 025. Nihal Abeysinghe | Yes |
| G 027. Wasantha Piyathissa | Yes |
| G 028. Gamagedara Dissanayake | Yes |
| G 031. Rathna Gamage | Yes |
| G 032. Mahinda Jayasinghe | Yes |
| G 033. Chathuranga Abeysinghe | Yes |
| G 034. Eranga Gunasekara | Yes |

| | |
|---|---|
| G 038. Prasanna Gunasena | Yes |
| G 039. Anton Jayakody | Yes |
| G 044. Susil Ranasinghe | Yes |
| G 045. Hansaka Wijemuni | Yes |
| G 046. Eranga Weeraratne | Yes |
| G 047. Namal Sudarshana | Yes |
| G 048. P. Ruwan Senarath | Yes |
| G 049. Madhura Senevirathna | Yes |
| G 050. Arun Hemachandra | Yes |
| G 051. Janitha Ruwan Kodithuwakku | Yes |
| G 052. Aruna Jayasekera | Yes |
| G 057. Manjula Suraweera Arachchi | Yes |
| G 058. K. Ilankumaran | Yes |
| G 059. Shantha Pathma Kumara Subasingha | Yes |
| G 060. Samanmali Gunasingha | Yes |
| G 061. Gayan Janaka | Yes |
| G 062. Ajith Agalakada | Yes |
| G 064. Roshan Akmeemana | Yes |
| G 066. L.M. Abeywickrama | Yes |
| G 067. M.K.M. Aslam | Yes |
| G 068. Kaushalya Ariyarathne | Yes |
| G 069. Asitha Niroshana Egoda Vithana | Yes |
| G 070. Arkam Ilyas | Yes |
| G 071. Oshani Umanga | Yes |
| G 072. Krishnan Kalaichelvi | Yes |
| G 073. Upul Kithsiri | Yes |
| G 074. Wasantha Pushpa Kumara | Yes |
| G 075. Chaminda Lalith Kumara | Yes |
| G 076. Sarath Kumara | Yes |
| G 077. Nilanthi Kottahachchi | Yes |
| G 078. M.A.C.S. Chathuri Gangani | Yes |
| G 079. Lasith Bhashana Gamage | Yes |
| G 082. Ajantha Gammeddage | Yes |
| G 083. Ajith Gihan | Yes |

| | |
|---|---|
| G 084. Jagath Gunawardana | Yes |
| G 085. Aboobucker Athambawa | Yes |
| G 086. Ruwanthilaka Jayakody | Yes |
| G 087. Thushari Jayasingha | Yes |
| G 088. T.K. Jayasundara | Yes |
| G 089. Mayilvaganam Jegatheeswaran | Yes |
| G 091. Sellaththamby Thilaganathan | Yes |
| G 092. Anushka Thilakarathne | Yes |
| G 093. Chandana Thennakoon | Yes |
| G 094. Thanura Dissanayake | Yes |
| G 095. Dharmapriya Dissanayake | Yes |
| G 096. Sujeewa Dissanayake | Yes |
| G 097. Sugath Wasantha de Silva | Yes |
| G 098. Susantha Dodawatta | Yes |
| G 099. Susantha Kumara Nawarathna | Yes |
| G 101. Najith Indika | Yes |
| G 102. Aruna Panagoda | Yes |
| G 103. Nimal Palihena | Yes |
| G 104. Nishantha Perera | Yes |
| G 105. Stepni Fernando | Yes |
| G 106. Kanthasamy Prabu | Yes |
| G 107. Lal Premanath | Yes |
| G 108. Nanda Bandara | Yes |
| G 109. Padmasiri Bandara | Yes |
| G 110. Ravindra Bandara | Yes |
| G 111. Sudath Balagalla | Yes |
| G 112. Sri Bavanandarajah | Yes |
| G 113. E. M. Basnayaka | Yes |
| G 114. Wijesiri Basnayake | Yes |
| G 115. Lakmali Hemachandra | Yes |
| G 116. S. Sandaruwan Madarasinghe | Yes |
| O 001. Mano Ganeshan | No |
| O 002. Kabir Hashim | No |
| O 006. R.M.Ranjith Madduma Bandara | No |

| | |
|---|---|
| O 007. Gayantha Karunathilleka | No |
| O 008. Sajith Premadasa | No |
| O 017. M.A.M. Thahir | No |
| O 021. Dayasiri Jayasekara | No |
| O 022. Harsha de Silva | No |
| O 023. Ajith P. Perera | No |
| O 024. Sujeewa Senasinghe | No |
| O 027. J. C. Alawathuwala | No |
| O 029. Hector Appuhamy | No |
| O 030. Hesha Withanage | No |
| O 031. Kavinda Heshan Jayawardhana | No |
| O 034. Imran Maharoof | No |
| O 041. Chaminda Wijesiri | No |
| O 042. Mujibur Rahman | No |
| O 046. W.H.M. Dharmasena | No |
| O 049. Chamindranee Kiriella | No |
| O 050. Chathura Galappaththi | No |
| O 051. Chithral Fernando | No |
| O 052. Amila Prasad | No |
| O 058. Abthul Wazeeth | No |
| O 062. Jagath Vithana | No |
| O 064. Nissam Kariyappar | No |
| O 065. Prageeth Madhuranga | Yes |
| O 066. Jagath Manuwarna | Yes |
| O 067. Ruwan Mapalagama | Yes |
| O 068. Nandana Millagala | Yes |
| O 069. Riyas Farook | Yes |
| O 070. Danushka Ranganath | Yes |
| O 071. Sanjeewa Ranasingha | Yes |
| O 072. Sunil Rathnasiri | Yes |
| O 082. A.M.M.M. Rathwaththe | Yes |
| O 083. Manoj Rajapaksha | Yes |
| O 084. Sunil Rajapaksha | Yes |
| O 085. Hasara Liyanage | Yes |

| | |
|---|---|
| O 086. Deepthi Wasalage | Yes |
| O 087. Kanchana Welipitiya | Yes |
| O 088. R. G. Wijerathna | Yes |
| O 089. Nishantha Samaraweera | Yes |
| O 091. Ruwan Wijeweera | Yes |
| O 092. Darmapriya Wijesinghe | Yes |
| O 093. Hiruni Wijesinghe | Yes |
| O 094. Athula Welandagoda | Yes |
| O 096. Dinindu Saman | Yes |
| O 097. Thilina Samarakoon | Yes |
| O 100. Chandana Sooriyaarachchi | Yes |
| O 101. G.D. Sooriyabandara | Yes |
| O 102. Aravinda Senarath | Yes |
| O 103. Kitnan Selvaraj | Yes |
| O 104. Janaka Senarathna | Yes |
| O 105.Chandima Hettiaratchi | Yes |
| O 106. Champika Hettiarachchi | Yes |
| O 107. Dinesh Hemantha | Yes |
| O 108. Geetha Herath | Yes |
| O 111. Ashoka Gunasena | Yes |
| O 112. Nandana Pathmakumara | Yes |
| O 113. Sunil Biyanwila | Yes |
| O 114. Samantha Ranasingha | Yes |
| O 115. Nishantha Jayaweera | Yes |

ඒ අනුව, පනත් කෙටුම්පත දෙවැනිවර කියවන ලදී.

"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය"යි බලශක්ති අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තදනන්තරව පාර්ලිමේන්තුව සම්මුති මාර්ගයෙන් කාරක සභාවකට පරිවර්තනය විය.

(කාරක සභාවේ දී)

මූලාසනාරූඪ මන්ත්‍රීවරයා මූලාසනාරූඪ විය.

1 වැනි වගන්තියේ සිට 3 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

4 වැනි වගන්තිය

බලශක්ති අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 3 වැනි පිටුවේ 13 වැනි පේළිය සහ 14 වැනි පේළිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> "සැලැස්ම සහ දීර්ඝකාලීන සම්ප්‍රේෂණ සංවර්ධන සැලැස්ම ලංකා විදුලිබල මණ්ඩලය"

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

5 වැනි වගන්තිය

බලශක්ති අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 4 වැනි පිටුවේ 30 වැනි පේළිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> "යන වචන වෙනුවට, "විවිධාංග කරන ලද"

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

6 වැනි වගන්තිය සහ 7 වැනි වගන්තිය සභා සම්මත විය.

8 වැනි වගන්තිය

බලශක්ති අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 8 වැනි පිටුවේ 27 වැනි පේළිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> "ලැබිය හැකි ය."

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

බලශක්ති අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 8 වැනි පිටුවේ 27 වැනි පේළියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමට:—

> "(2ඉ) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන කමිටුව, 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගත යුතු ය."

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

9 වැනි වගන්තිය සභා සම්මත විය.

10 වැනි වගන්තිය

බලශක්ති අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 11 වැනි පිටුවේ 9 වැනි පේළියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමට:—

> "(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදයේ "ශ්‍රී ලංකාවේ විදුලිබල පද්ධතියේ" යන වචන වෙනුවට, "අඛණ්ඩ සහ විශ්වාසදායක විදුලිබල සැපයුමක් සහතික කරමින් ශ්‍රී ලංකාවේ විදුලිබල පද්ධතියේ" යන වචන ආදේශ කිරීමෙන්"

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

11 වැනි වගන්තිය

බලශක්ති අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 13 වැනි පිටුවේ 30 වැනි පේළිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> "මගින් නිශ්චිතව දක්වා ඇති පරිදි තරඟකාරී ආනුෂංගික සේවා"

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

12 වැනි වගන්තිය සභා සම්මත විය.

13 වැනි වගන්තිය

බලශක්ති අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 14 වැනි පිටුවේ 20 වැනි පේළිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> "I වන උපලේඛනයේ (අ), (ඉ), (ඊ), (උ), (ඌ) (i) සහ (ඌ)"

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

බලශක්ති අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 15 වැනි පිටුවේ 19 වැනි පේළියේ සිට 35 වැනි පේළිය දක්වා පේළි (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

> "දක්වා ඇති සමාගම් සහ I වන උපලේඛනයේ (එ)(i) අයිතමයේ දක්වා ඇති ජල විදුලිබල උත්පාදනයට අදාළ සමාගම හැර, මේ වගන්තිය යටතේ සංස්ථාගත කරන ලද අනුප්‍රාප්තික සමාගම්වල කොටස්වලින් සියයට සියයක් ආරම්භයේ දී භාණ්ඩාගාරයේ ලේකම්වරයා වෙත පවරනු ලැබිය යුතු අතර, I වන උපලේඛනයේ (අ), (ඉ), (ඊ), (උ) සහ (ඌ)(ii) අයිතමවල දක්වා ඇති සමාගම් සහ I වන උපලේඛනයේ (එ)(i) අයිතමයේ දක්වා ඇති ජල විදුලිබල උත්පාදනයට අදාළ සමාගම සම්බන්ධයෙන් වන විට කොටස්වලින් සියයට සියයක් භාණ්ඩාගාරයේ ලේකම්වරයා වෙත ස්ථිරවම පවරනු ලැබිය යුතු ය. සහ"

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

බලශක්ති අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 16 වැනි පිටුවේ 1 වැනි පේළියේ සිට 6 වැනි පේළිය දක්වා පේළි (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කරන්න.

"සංශෝධනය පිළිගත යුතු ය." යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

බලශක්ති අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 19 වැනි පිටුවේ 7 වැනි පේළියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමට:—

"(7) I වන උපලේඛනයේ (ඌ)(i) අයිතමයේ දක්වා ඇති සමාගමේ කටයුතු පරිපාලනය හා කළමනාකරණය, පහත දැක්වෙන සාමාජිකයන් පස් දෙනෙකුගෙන් සමන්විත වන අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන අධ්‍යක්ෂ මණ්ඩලයක් වෙත සතු කරනු ලැබිය යුතු අතර ඔවුන්ගෙන් එක් අයකු අමාත්‍යවරයා විසින් සභාපති ලෙස පත් කරනු ලැබිය යුතු ය:-

(අ) අතිරේක ලේකම්වරයකුගේ තනතුරට වඩා අඩු නොවන තනතුරක් හෝ ඒ හා සමාන තත්ත්වයක් දරනු ලබන අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ යම් නියෝජිතයකු;

(ආ) භාණ්ඩාගාරයේ යම් නියෝජ්‍ය ලේකම්වරයකු;

(ඇ) විදුලිබල ක්ෂේත්‍රයේ ආයතනික කළමනාකරණය පිළිබඳ අවම වශයෙන් වසර පහළොවක පළපුරුද්දක් ඇති එක් තැනැත්තකු;

(ඈ) ප්‍රසම්පාදනය පිළිබඳ අවම වශයෙන් වසර පහළොවක පළපුරුද්දක් ඇති එක් තැනැත්තකු;

(ඉ) පහත දැක්වෙන ක්ෂේත්‍ර එකක හෝ ඊට වැඩි සංඛ්‍යාවක අවම වශයෙන් වසර පහළොවක පළපුරුද්දක් ඇති එක් තැනැත්තකු:-

(i) මූල්‍ය කළමනාකරණය;
(ii) ආර්ථික විද්‍යාව;
(iii) ගිණුම්කරණය; හෝ
(iv) වාණිජ නීතිය."

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

බලශක්ති අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 19 වැනි පිටුවේ 10 වැනි සහ 11 වැනි පේළි ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"කළමනාකරණය, පහත දැක්වෙන සාමාජිකයන් නව දෙනෙකුගෙන් සමන්විත වන අමාත්‍යවරයා විසින් පත්"

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

බලශක්ති අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 20 වැනි පිටුවේ 2 වැනි පේළිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"(iv) වාණිජ නීතිය;

(ඈ) නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ ලංකා විදුලිබල මණ්ඩලයේ සේවය කරමින් සිටින සේවානියුක්තයන් සහ ලංකා විදුලිබල මණ්ඩලයේ පෙර සේවානියුක්තයන් අතරින් තැනැත්තන් හතර දෙනෙකු."

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

බලශක්ති අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 20 වැනි පිටුවේ 4 වැනි පේළිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"වන, (7) වන සහ (8) වන උපවගන්තිවල දක්වා ඇති සමාගම්වල"

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

බලශක්ති අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 20 වැනි පිටුවේ 11 වැනි පේළියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමට:—

"(ඇ) (4) වන, (5) වන, (6) වන, (7) වන සහ (8) වන උපවගන්තිවල දක්වා ඇති සමාගම්වල සහ I වන උපලේඛනයේ (එ)(i) සහ (එ)(ii) වන අයිතම වල දක්වා ඇති සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඔවුන් එම අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂවරයකු ලෙස ධුරය භාර ගැනීමට පෙරතුව ඔවුන්ගේ පත්වීමේ දිනය වන විට පවතින ස්වකීය බැඳියාවන් පිළිබඳ පොදු අනාවරණය කිරීමක් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(ඈ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, ඉදිරියේ දී සළකා බැලිය යුතු යම් කාරණයක් සම්බන්ධයෙන්, ඍජුව හෝ වක්‍රව යම් බැඳියාවක් ඇති (4) වන, (5) වන, (6) වන, (7) වන සහ (8) වන උපවගන්තිවල දක්වා ඇති සමාගම්වල සහ I වන උපලේඛනයේ (එ)(i) සහ (එ)(ii) වන අයිතම වල දක්වා ඇති සමාගම්වල යම් අධ්‍යක්ෂවරයකු විසින් එකී බැඳියාවේ ස්වභාවය අධ්‍යක්ෂ මණ්ඩලය වෙත අනාවරණය කරනු ලැබිය යුතු අතර එම කාරණය සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ යම් සාකච්ඡාවකට හෝ තීරණයකට සහභාගී නොවිය යුතු ය.

(ඉ) අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ හෝ මහා භාණ්ඩාගාරයේ හෝ නියෝජිතයකු නොවන යම් තැනැත්තකු විසින් I වන උපලේඛනයේ (අ) වන, (ඉ) වන, (ඊ) වන, (උ) වන, (ඌ)(i) වන, (එ) (i) වන සහ (එ)(ii) වන අයිතම වල දක්වා ඇති සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩල දෙකක හෝ ඊට වැඩි ගණනක සාමාජිකයකු ලෙස පත් කරනු නොලැබිය යුතු ය."

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

බලශක්ති අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 20 වැනි පිටුවේ 12 වැනි පේළිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"(9) (4) වන, (5) වන, (6) වන, (7) වන සහ (8) වන"

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

14 වැනි වගන්තිය

බලශක්ති අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 21 වැනි පිටුවේ 14 වැනි පේළියේ සිට 23 වැනි පේළිය දක්වා පේළි (එම පේළි දෙක ද ඇතුළත්ව) ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ -

(අ) (ආ) ඡේදයේ "අවුරුදු දෙකකට පසු නොවන දිනයක" යන වචන වෙනුවට, "අවුරුදු එකකට පසු නොවන දිනයක" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) (ඇ) ඡේදයේ -

(i) "I වන උපලේඛනයේ (අ), (ඊ) සහ (ඌ) (ii) අයිතමවල" යන වචන සහ ඉලක්කම් වෙනුවට, "I වන උපලේඛනයේ (අ), (ඉ), (ඊ), (උ) සහ (ඌ) (ii) අයිතමවල" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ii) "බැහැර කරනු ලැබිය හැකි ය:" යන වචනවල සිට ඒ උපවගන්තියේ අවසානය දක්වා වූ සියලු වචන වෙනුවට, "බැහැර කරනු ලැබිය හැකි ය." යන වචන ආදේශ කිරීමෙන්; සහ"

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

බලශක්ති අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 22 වැනි පිටුවේ 3 වැනි පේළියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමට:—

"(ආ) ඒ උපවගන්තියේ (ඉ) ඡේදයේ (ii) වන අනුඡේදයේ "සේවකයන්ගේ අර්ථසාධක අරමුදලේ වගකීම්" යන වචන වෙනුවට, "සේවකයන්ගේ අර්ථසාධක අරමුදලේ සහ විශ්‍රාම වැටුප් අරමුදලේ වගකීම්" යන වචන ආදේශ කිරීමෙන්";"

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

බලශක්ති අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 22 වැනි පිටුවේ 9 වැනි පේළිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"කිරීමෙන්;"

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

බලශක්ති අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් සංශෝධනයක්: 22 වැනි පිටුවේ 9 වැනි පේළියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමට:—

"(ඇ) ඒ උපවගන්තියේ (උ) ඡේදයේ "අරමුදල් මූලාශ්‍රය හඳුනා ගනු ලැබිය යුතු ය." යන වචන වෙනුවට, "අරමුදල් මූලාශ්‍රය හඳුනා ගනු ලැබිය යුතු ය;" යන වචන ආදේශ කිරීමෙන්;

(ඈ) ඒ උපවගන්තියේ (උ) ඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් ඡේද ඇතුළත් කිරීමෙන්:-

"(ඖ) අවසාන පැවරීමේ සැලැස්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දිනයේ සිට අවුරුද්දකට පෙරාතුව ම වූ දිනයේ දී (මේ ඡේදයේ "උත්පාදන සමාගම" යනුවෙන් සඳහන් කරනු ලබන) I වන උපලේඛනයේ (අ) අයිතමයේ දක්වා ඇති උත්පාදන සමාගමේ ධූර දරන සියලුම නිලධරයන් සහ සේවකයන් -

(i) උත්පාදන සමාගම විසින් නිසි පරිදි හඳුනා ගනු ලබන බවට;

(ii) අවසාන පැවරීමේ සැලැස්ම ගැසට් පත්‍රයේ පළ කිරීමේ දිනයේ සිට මාස හතරක් ඇතුළත, I වන උපලේඛනයේ (එ)(i) අයිතමයේ දක්වා ඇති අදාළ අනුප්‍රාප්තික සමාගම් වෙත, ඔවුන්ගේ යෝජිත අනියුක්ත කිරීම සම්බන්ධයෙන් උත්පාදන සමාගම විසින්, දැනුම් දෙනු ලබන බවට; සහ

(iii) (ii) වන උපඡේදයේ දක්වා ඇති දැන්වීම ලැබීමෙන් පසු මාස දෙකක් ඇතුළත I වන උපලේඛනයේ (එ)(i) අයිතමයේ දක්වා ඇති එකී අදාළ අනුප්‍රාප්තික සමාගම්වලට අනියුක්ත වීමට ඔවුන් තෝරා ගන්නේ ද නැති ද යන්න උත්පාදන සමාගම වෙත දැනුම් දිය යුතු බවට,

සහතික විය යුතු අතර, අවසාන පැවරීමේ සැලැස්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දිනයේ සිට අවුරුද්දකට පසුව වන දිනයේ සිට බලපැවැත්වෙන පරිදි ලංකා විදුලිබල මණ්ඩලයේ සේවානියුක්ත ගිවිසුම යටතේ නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ඔවුන් විසින් භුක්ති විඳිනු ලැබූ නියම සහ කොන්දේසිවලට වඩා අඩුවෙන් වාසිදායක නොවන නියම සහ කොන්දේසි මත අවසාන පැවරීමේ සැලැස්ම යටතේ I වන උපලේඛනයේ (එ)(i) අයිතමයේ දක්වා ඇති එකී අනුප්‍රාප්තික සමාගම් වෙත අනියුක්ත කරනු ලැබිය යුතු ය. යම් සේවා නියුක්තයකු අවසාන පැවරීමේ සැලැස්ම යටතේ I වන උපලේඛනයේ (එ)(i) අයිතමයේ දක්වා ඇති යම් අනුප්‍රාප්තික සමාගමකට අනියුක්ත වීමට තෝරා නොගන්නා අවස්ථාවක දී, එකී සේවානියුක්තයා ස්වේච්ඡා විශ්‍රාම යාමේ යෝජනා ක්‍රමයකට හිමිකම් ලැබිය යුතු අතර, එකී යෝජනා ක්‍රමයේ නියම සහ කොන්දේසි අවසාන පැවරීමේ සැලැස්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දිනයේ සිට මාස හතරක් ඇතුළත නියම කරනු ලැබිය යුතු ය; සහ

(ඒ) අවසාන පැවරීමේ සැලැස්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දිනයේ සිට අවුරුද්දකට පෙරාතුව ම වූ දිනයේ දී (මේ ඡේදයේ "බෙදාහැරීමේ සමාගම" යනුවෙන් සඳහන් කරනු ලබන) I වන උපලේඛනයේ (උ) අයිතමයේ සඳහන් බෙදාහැරීමේ සමාගමේ ධූර දරන සියලුම නිලධරයන් සහ සේවකයන්-

(i) බෙදාහැරීමේ සමාගම විසින් නිසි පරිදි හඳුනා ගනු ලබන බවට;

(ii) අවසාන පැවරීමේ සැලැස්ම ගැසට් පත්‍රයේ පළ කිරීමේ දිනයේ සිට මාස හතරක් ඇතුළත, I වන උපලේඛනයේ (එ)(ii) අයිතමයේ දක්වා ඇති අදාළ අනුප්‍රාප්තික සමාගම් වෙත, ඔවුන්ගේ යෝජිත අනියුක්ත කිරීම සම්බන්ධයෙන් බෙදාහැරීමේ සමාගම විසින් දැනුම් දෙනු ලබන බවට; සහ

(iii) (ii) වන උපඡේදයේ දක්වා ඇති දැන්වීම ලැබීමෙන් පසු මාස දෙකක් ඇතුළත, I වන උපලේඛනයේ (එ)(ii) අයිතමයේ දක්වා ඇති එකී අදාළ අනුප්‍රාප්තික සමාගම්වලට අනියුක්තවීමට ඔවුන් තෝරා ගන්නේ ද නැතිද යන්න බෙදාහැරීමේ සමාගම වෙත දැනුම් දිය යුතු බවට,

සහතික විය යුතු අතර, අවසාන පැවරීමේ සැලැස්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දිනයේ සිට අවුරුද්දකට පසුව වන දිනයේ සිට බලපැවැත්වෙන පරිදි ලංකා විදුලිබල මණ්ඩලයේ සේවානියුක්ත ගිවිසුම යටතේ නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ඔවුන් විසින් භුක්ති විඳිනු ලැබූ නියම සහ කොන්දේසිවලට වඩා අඩුවෙන් වාසිදායක නොවන නියම සහ කොන්දේසි මත අවසාන පැවරීමේ සැලැස්ම යටතේ I වන උපලේඛනයේ (එ)(ii) අයිතමයේ දක්වා ඇති එකී අනුප්‍රාප්තික සමාගම් වෙත අනියුක්ත කරනු ලැබිය යුතු ය. යම් සේවානියුක්තයකු අවසාන පැවරීමේ සැලැස්ම යටතේ I වන උපලේඛනයේ (එ)(ii) අයිතමයේ දක්වා ඇති යම් අනුප්‍රාප්තික සමාගමකට අනියුක්තවීමට තෝරා නොගන්නා අවස්ථාවක දී, එකී සේවානියුක්තයා ස්වේච්ඡා විශ්‍රාම යාමේ යෝජනා ක්‍රමයකට හිමිකම් ලැබිය යුතු අතර, එකී යෝජනා ක්‍රමයේ නියම සහ කොන්දේසි අවසාන පැවරීමේ සැලැස්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දිනයේ සිට මාස හතරක් ඇතුළත නියම කරනු ලැබිය යුතු ය."

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

15 වැනි වගන්තියේ සිට 18 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

19 වැනි වගන්තිය

බලශක්ති අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංශෝධනයක්: 27 වැනි පිටුවේ 20 වැනි පේළිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට:—

"උපාය මාර්ග සහ ගැසට් පත්‍රයේ පළ කරන ලද ඊට පසුව සිදු කරන ලද ප්‍රතිශෝධන සහ යාවත්කාලීන කිරීම් අදහස් වේ;"

"සංශෝධනය පිළිගත යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

20 වැනි වගන්තිය සහ 21 වැනි වගන්තිය සභා සම්මත විය.

අලුත් වගන්ති

බලශක්ති අමාත්‍යවරයා ඉදිරිපත් කළ අලුත් වගන්තිය: 24 වැනි පිටුවේ 16 වැනි පේළියට ඉකිබිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කිරීමට:—

"ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය සංශෝධනය කිරීම

17. ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "උත්පාදනයේ සහ බෙදා හැරීමේ නිරත වන අවස්ථාවක දී සහ එසේ උත්පාදනය කළ විදුලි ධාරිතාවය හෝ ප්‍රමාණය" යන වචන වෙනුවට, "උත්පාදනයේ, බෙදා හැරීමේ හෝ සැපයීමේ නිරත වන අවස්ථාවක දී සහ එසේ උත්පාදනය කළ, බෙදා හරින ලද හෝ සපයන ලද විදුලි ධාරිතාවය හෝ ප්‍රමාණය" යන වචන ආදේශ කිරීමෙන්;"

"වගන්තිය දෙවැනිවර කියවිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය පනත් කෙටුම්පතට එකතු කළ යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

බලශක්ති අමාත්‍යවරයා ඉදිරිපත් කළ තවත් අලුත් වගන්තියක්: 27 වැනි පිටුවේ 9 වැනි පේළියට ඉකිබිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කිරීමට:—

| | |
|---|---|
| "ප්‍රධාන ප්‍රඥප්තියේ 40 වන වගන්තිය සංශෝධනය කිරීම | 19. ප්‍රධාන ප්‍රඥප්තියේ 40 වන වගන්තිය, එහි "මේ පනතේ විධිවිධාන සඳහා හෝ ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය." යන වචන වෙනුවට, "මේ පනතේ විධිවිධාන අදාළ විය යුතු යම් තැනැත්තකුට හෝ පුද්ගල මණ්ඩලයකට හෝ යම් තැනැත්තකු හෝ පුද්ගල මණ්ඩලයක් සම්බන්ධයෙන් අදාළ විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ." |

"වගන්තිය දෙවැනිවර කියවිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය පනත් කෙටුම්පතට එකතු කළ යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය

"ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත සංශෝධන සහිතව වාර්තා කරන ලදී.

"පනත් කෙටුම්පත දැන් සංශෝධිතාකාරයෙන් තුන්වැනිවර කියවිය යුතු ය"යැයි බලශක්ති අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව, සංශෝධිතාකාරයෙන් තුන්වැනිවර කියවා සභා සම්මත කරන ලදී.

**7. දුම්කොළ බදු පනත යටතේ නියමය:** අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යවරිය වෙනුවෙන් ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව,— සංශෝධිත, 1999 අංක 8 දරන දුම්කොළ බදු පනතේ 2 වගන්තිය යටතේ බීඩි සඳහා දුම්කොළ බද්දක් පැනවීම සම්බන්ධයෙන් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 අප්‍රේල් 01 දිනැති අංක 2430/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.07.11 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**8. තේ (අපනයන බදු සහ පාලන) පනත යටතේ නියෝග:** වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යවරයා වෙනුවෙන් ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව,— 1959 අංක 16 දරන තේ (අපනයන බදු සහ පාලන) පනතේ 7(1) සහ 8(2) වගන්ති සමඟ කියවිය යුතු 15 වගන්තිය යටතේ ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සභාපති විසින් සාදන ලදුව, 2023 අගෝස්තු 05 දිනැති අංක 2343/63 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.07.11 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**9. කල් තැබීම:** "මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතු ය" යි පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් යෝජනා කරන ලදී.

එකල්හි වේලාව අ.භා. 5.30 පසුකර තිබූයෙන්, අ.භා. 6.01 ට මූලාසනාරූඪ මන්ත්‍රීවරයා විසින් අද දින සභා සම්මතිය අනුව, පාර්ලිමේන්තුව කල් තබන ලදී.

ඊට අනුකූලව, පාර්ලිමේන්තුව 2025 අගෝස්තු 07 බ්‍රහස්පතින්දා පූ.භා. 9.30 වනතෙක් කල් ගියේ ය.